1 සිට 10 දක්වා

(22) (1)

වගා ආධාර චක්‍රලේඛ අංක 01.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ 03.
1988.10.11 දි.න.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

**මාතෘකාව:** **සියලු තේ වගා සහනාධාර ක්‍රම යටතේ වී.ආර්.අයි. 2023 ක්ලෝනයේ තේ පැල වගා කිරීම.**

1.0 <u>චක්‍රලේඛයේ පරමාර්ථය:</u>

1.1 වී.ආර්.අයි. 2023 ක්ලෝනය පහත් බිම් ප්‍රදේශවල (මුහුදු මට්ටමේ සිට උස අඩි 2000 තෙක්) වගා කිරීම සඳහා නිර්දේශිත තේ ක්ලෝන ලැයිස්තුවෙන් 1984 දී ඉවත් කරන ලදි. එහෙත් මෙම ක්ලෝනය නිශ්චිත ලෙස හඳුනා ගැනීමේ අපහසුතාවය නිසා අනිකුත් ක්ලෝනවල තේ පැල සමග එම ක්ලෝනයේ පැල මිශ්‍රව වගා කර ඇති අවස්ථාවන් පිළිබඳව අනාවරණය වී ඇත.

1.2 මෙබඳු ව්‍යාකූල තත්ත්වයකට මුහුණ දුන් කුඩා තේ ඉඩම් හිමියන්ට යම් සහනයක් සැලසීම මෙම චක්‍රලේඛයේ පරමාර්ථයයි.

2.0 <u>ක්‍රියා මාර්ගය:</u> පහත දැක්වෙන ක්‍රියා මාර්ගය මින් ඉදිරියට අනුගමනය කරන්න.

2.1 වී.ආර්.අයි. 2023 අනුමත ක්ලෝන ලැයිස්තුවෙන් ඉවත් කරන ලද ප්‍රදේශයන්හි සියලුම වගා සහනාධාර ක්‍රම යටතේ අවසර දී ඇති බිම් ප්‍රමාණයන්හි වී.ආර්.අයි. 2023 ක්ලෝනය සියයට දහයක් (10%) හෝ ඊට අඩු ප්‍රතිශතයක් පමණක් ඇත්නම්, සම්පූර්ණ වාරික මුදල ගෙවන්න.

2.2 වී.ආර්.අයි. 2023 ක්ලෝනය 10% ඉක්මවා වගා කර ඇත්නම්, 10% සිට එම සීමාව දක්වා වෙනස පමණක් අවසර පත්‍රයේ සඳහන් බිම් ප්‍රමාණයෙන් හෝ පාළු පිරවීමේ ආධාර ක්‍රමය යටතේ නම් පැල සංඛ්‍යාවෙන් අඩුකොට ගෙවීම් කරන්න.

එනම්, (අ) හෙක්ටයාර් එකක අවසර පත්‍රයක් යටතේ පැල සිටුවීම සම්පූර්ණව කිරීමේදී වී.ආර්.අයි. 2023 පැල 25% ක් දක්නට ඇත්නම් පැල සිටුවීමේ වාරිකයෙන් හා පසු වාරිකවලින් පමණක් 15% ක් අඩුකර ගෙවන්න. පූර්ව වාරික ගෙවීම් ආපසු අය නොකරන්න.

උදා: 10% ට වඩා වැඩිවන ප්‍රතිශතය = 25 − 10 = 15

∴ ගෙවිය හැකි ප්‍රතිශතය = 100 − 15 = 85

නැවත වගාව යටතේ හෙක්: 01 ක

පැල සිටුවීමේ වාරික මුදල = රුපියල් 12000/=

∴ ඉහත අඩු කිරීමෙන් පසුව

ගෙවිය යුතු මුදල = රුපියල් 12000 X $\frac{85}{100}$

= රුපියල් 10200/=

ඇ.පි.බ. (

(ආ) තේ පැල 5000 ක් යොදා පාළු සපයා ඇති විටකදී 12% ක් වී.ආර්.අයි. 2023 ක්ලෝනයේ පැල දක්නට ලැබේ නම් අනුමත පැල සංඛ්‍යාව වූ 5000 න් 2% ක් අඩුකොට සියයට 98 ක් (පැල 4900 ක්) සඳහා ගෙවීම් කරන්න.

උදා: වී.ආර්.අයි. 2023 පැල සංඛ්‍යාව = 12%

∴ 10% ට වැඩිවන ප්‍රතිශතය = (12% - 10%) = 2%

∴ ගෙවිය හැකි ප්‍රතිශතය = 98%

පාළු සපයා ඇති පැල ගණන = 5000

පළමු වාරිකය සඳහා ගෙවිය යුතු මුදල = $\frac{5000}{1} \times 2.50 \times \frac{98}{100}$

= <u>රුපියල් 12250/=</u>

2.3 අංක 134 දරන චක්‍රලේඛ ලිපිය අනුව 1985.12.31 වෙනි දිනට පසු අවලංගු වී ඇති ඉහත අංක (02) දරන වගන්තිය යටතේ සුදුසුකම් ලබන අවසර පත්‍ර නැවත වලංගුකොට අදාල ගෙවීම් මාස 02 ක කාලයක් ඇතුලත සිදුකොට එසේ ගෙවීම් සම්පූර්ණ කරන ලද ලිපිගොනු ලැයිස්තුවක් මා වෙත එවන්න. ඉහත සංශෝධනයන් ක්‍රියාත්මක කිරීමේදී අවසර පත්‍ර බීම් ප්‍රමාණ සංශෝධනයක් අනවශ්‍ය බව සලකන්න.

3.0 මෙම කරුණය සම්බන්ධයෙන් මීට ඉහත නිකුත් කර ඇති පහත දැක්වෙන චක්‍රලේඛ සහ උපදෙස් ලිපිවල වී.ආර්.අයි. 2023 භාවිතය පිළිබඳ අදාල උපදෙස් අභිභවා මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වේ.

1. ව්‍යා/ව.ආ/ප්‍රති - 1984.01.05 දිනැති චක්‍රලේඛ අංක 48
2. ව්‍යා/ව.ආ/ප්‍රති - 1985.08.12 දිනැති උපදෙස් ලිපිය
3. ව්‍යා/ව.ආ/ප්‍රති - 1985.09.03 දිනැති උපදෙස් ලිපිය
4. ව්‍යා/ව.ආ/ප්‍රති - 1985.11.07 දිනැති උපදෙස් ලිපිය
5. ව්‍යා/ව.ආ/ප්‍රති - 1986.04.22 දිනැති චක්‍රලේඛ අංක 134

4.0 වී.ආර්.අයි. 2023 ක්ලෝනය අනුමත තේ ක්ලෝන ලැයිස්තුවට අඩංගු කර නොමැති බවත්, මෙය හුදෙක් සහනයක් සැලසීමක් වශයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ගයක් බවත් විශේෂයෙන් සලකන්න.

(වී.ජේ. නානායක්කාර)
සභාපති.

පිටපත්:-

1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2. සාමාන්‍යාධිකාරී
3. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
4. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
5. අභ්‍යන්තර විගණක
6. ලේඛම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
7. සියලු තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
8. සියලුම කම්හල් අධිකාරීන්